**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආරෝග්‍යශාලා මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආරෝග්‍යශාලා මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආරෝග්‍යශාලා මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආරෝග්‍යශාලා මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා

වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලිද ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආරෝග්‍යශාලා මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආරෝග්‍යශාලා මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.197,080,968 ක් වූ වත්කම්වල ඵලදායී ජීවකාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් පිළිබඳව වාර්තාවක් පිළියෙල කොට එහි ප්‍රත්‍යාගණන කටයුතු සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කොට ඇති බව හා කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මෙම කටයුත්තට නිලධාරීන් යෙදවීම අපහසු බව. | ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කරමින් මෙම වැරදි නිවැරදි කර 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට උපචිත උපදේශක ගාස්තු රු.30,981,636 ක් හා උපචිත විවිධ වියදම් රු.3,535,910 ක් ගිණුම්ගත කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.34,517,546 ක් අඩුවෙන් දැක්වුණි. | සභාපතිතුමියගේ අනුමැතිය ලැබී නොතිබුණු බැවින් ගිණුම්ගත නොකළ බව. | මෙම වරද නිවැරදි කර 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | පරිත්‍යාග ලෙස ලැබී තිබුණු මුළු පිරිවැය රු.14,308,094 ක් වූ ජංගම නොවන වත්කම්වලට අදාළව සමාලෝචිත වර්ෂයෙහි ක්‍රමක්ෂය වටිනාකම (amortization) රු.2,021,221ක් පරිත්‍යාග ගිණුමට හර කරනු වෙනුවට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට හර කර තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කර ඇති බව. | මෙම වරද නිවැරදි කර 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය පනතේ 7 වගන්තිය | ආරෝග්‍යශාලා මණ්ඩලය පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සීදුවේ පිහිටි ඉඩමේ අයිතිය 2021 අප්‍රේල් 30 දින වන විටත් ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. | ඔප්පු අංක 798 මගින් ඉඩමේ අයිතිය රෝහල් අධ්‍යක්ෂ මණ්ඩලයට පවරා ඇති බව. | පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි ඉඩමේ අයිතිය ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරා ගැනීම කඩිනමින් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571(2) වගන්තිය | වර්ෂ 2 ක් ඉක්මවූ රු.326,825 ක රඳවාගැනීම් හා රු.90,874 ක ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වර්ෂ 2 ක ඉක්මවූ රඳවාගැනීමේ මුදල් සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කළ නමුත් ඉල්ලීම් කර නොමැති බව හා 2021 වර්ෂයේදී ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය | අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුව ද, මෙම වාර්තාවේ දිනය වන විටත් බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර නොතිබුණි. | බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කටයුතු කර ඇති බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.73,649,566 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.64,968,925 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,680,641 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට, වෙනත් ආදායම් රු.1,374,616 කින් අඩු වීම හා වර්ෂයේ වියදම් රු.40,209,741 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2019 වර්ෂයේ දී සලසා ගෙන තිබුණු රු.මිලියන 256 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට රු.30,981,636ක් උපදේශක ගාස්තු ලෙස ගෙවීමේ බැඳීමකට එළඹ තිබුණි. කෙසේ වෙතත් මෙම වාර්තාවේ දිනය වන විට ඉදිකිරීම අත්හිටුවා තිබුණු බැවින් ඉදිරියේදී ගෙවීමට සිදුවන එම මුදල නිශ්කාර්ය වියදමක් වන බව නිරීක්ෂණය විය. | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව සියළුම කටයුතු අවසන් කොට කැබිනට් ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එවකට පත් නව රජය විසින් සියළු ඉදිකිරීම් කටයුතු වසර 2 ක කාලයකට අත්හිටුවා ඇති බව හා මෙම ව්‍යාපෘතිය ඉදිරියේ ක්‍රියාත්මක විය හැකි බැවින් මෙය නිෂ්කාර්ය වියදමක් ලෙස සැලකිය නොහැකි බව හා රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයක් නිසා මෙය ඔවුන්ගේ පාලනයෙන් බැහැරව සිදු වූවක් බව. | ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2017 දෙසැම්බර් 15 දින ලියාපදිංචි වෛද්‍ය නිලධාරී තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි. එසේම අනුමත ස්ථිර තනතුරු 05ක් සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවාගැනීමට කටයුතු නොකර කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 08 දෙනෙකු බඳවාගෙන තිබුණි. | රෝහලේ පවතින වෛද්‍යවරුන්ගේ හිඟය හේතුවෙන් ලියාපදිංචි වෛද්‍ය නිලධාරියෙකු බඳවාගත් බව, නව තනතුරක් ඇති කිරීමට අනුමැතිය ලබා දිය නොහැකි බව වැටුප් කොමිසම විසින් දන්වා ඇති බව, පුරප්පාඩු වෙනුවෙන් මෙම ලියාපදිංචි වෛද්‍යවරු සේවයේ යොදවා ඇති බව හා මේ හේතුවෙන් කිසිම මූල්‍ය අලාභයක් සිදු නොවූ බව, පුවත්පත් දැන්වීම් පළකර වෛද්‍ය නිලධාරීන් හා හෙද නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කළ නමුත් සුදුසු නිලධාරීන් ඉල්ලුම් නොකිරීම මත කොන්ත්‍රාත් පදනමින් සුදුසු නිලධාරීන් බඳවා ගැනීමට සිදු වූ බව හා රෝගී සත්කාරය අඛණ්ඩව පවත්වාගෙන යාමට මේ අයුරින් කටයුතු කිරීමට සිදුවූ බව. | රෝහල් කාර්ය මණ්ඩලය සඳහා නව තනතුරු ඇති කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. එසේම ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව, ආරෝග්‍යශාලා මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් නමින් නව තනතුරක් ඇතිකර එම තනතුර සඳහා 2019 සැප්තැම්බර් මාසයේ සිට නිලධාරියෙකු පත්කර තිබුණු අතර එදින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී වැටුප් හා දීමනා ලෙස රු.560,000 ක් ගෙවා තිබුණි. | 2018.10.03 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණයකට අනුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ කාර්යභාරය ඉටු කිරීමට හා අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට තාවකාලික පදනම මත දීමනාවක් ගෙවීමෙන් මෙම නිලධාරිනිය පත්කර ඇති බව. | රෝහල් කාර්ය මණ්ඩලය සඳහා නව තනතුරු ඇති කිරීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |